# ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම

## <u>ශිෂ්‍යත්ව ඉල්ලුම්පත පිරවීම සඳහා උපදෙස්</u>

*(ශිෂ්‍යත්ව ඉල්ලුම්පත පිරවීමට පෙර, පහත සඳහන් උපදෙස් සැලකිලිමත්ව කියවන්න)*

1. පසුගිය වසරේ අ:පො:ස (සා:පෙ) විභාගයට **පළමු වරට** පෙනී සිට, සියලු විෂයයන් සමත්ව, අවම වශයෙන් විෂයයන් 7 කට **A** සාමාර්ථ නොමැති නම්, ඔබගේ ඉල්ලුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ. එබැවින් **අවම <u>සුදුසුකම්</u> නොමැති නම් කරුණාකර මෙම ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් නොකරන්න.**

2. **අයදුම්කරුගේ සම්පූර්ණ නම**: මෙම නම, අ:පො:ස විභාග ප්‍රතිඵල සහතිකයේ තිබෙන නම සමග ගැලපිය යුතුය. ඔබ ශිෂ්‍යත්වයක් සඳහා තෝරා ගතහොත්, ඉංග්‍රීසියෙන් ලියන ලද නම, ශිෂ්‍යත්ව සහතිකයේ භාවිතා කරනු ලැබේ.

3. **ඊ-මේල් (තිබේ නම්)**: ඔබගේ ඉල්ලුම්පතේ යම් අපැහැදිලි කරුණක් වෙතොත්, එය ඉක්මනින් පැහැදිලි කර ගැනීමට මෙය ඉතා වැදගත්ය. ඊ-මේල් ලිපිනයක් දක්වතොත් එය නිතර බලා ඉක්මනින් පිලිතුරු සපයන ලිපිනයක් විය යුතුය.

4. **දුරකථන අංක (තිබේ නම්):** මෙය ප්‍රදේශ අංකය (Area Code) සමග විය යුතුය. ඔබ නිවසේ දුරකථනයක් නැතිනම්, ඔබගේ විශ්වාශවන්ත ඥාතිවරයකුගේ, අසල්වාසියකුගේ හෝ ගුරුවරයකුගේ දුරකථන අංකයක්, එය කවරකුගේද කියා සඳහන් කොට දක්වන්න.

   උදාහරණයක් වශයෙන්, ඔබ කොළඹ ප්‍රදේශයේ අසල්වාසියකුගේ දුරකථන අංකයක් සඳහන් කලහොත් එය "(11) 2223333 (අසල්වාසී)" ලෙස දක්වන්න. දුරකථන අංකයක් නැති විට, ඔබගේ ඉල්ලුම්පතේ යම් අපැහැදිලි කරුණක් වෙතොත්, එය ප්‍රතික්ෂේප කිරීමට සිදුවේ.

5. **උපන් දිනය (දිනය/මාසය/වසර)**: ඔබගේ උපන් දිනය උදාහරණයක් වශයෙන්, අප්‍රියෙල් 3, 1994 නම්, එය "03 අප්‍රියෙල් 1994" ලෙස දක්වන්න. එය 3.4.94 හෝ 4.3.94 ලෙස සඳහන් කලහොත්, නිවැරදි දිනය සහ මාසය කුමක්ද කියා පැහැදිලි නැත.

6. **G.C.E. (O/L) විෂයයන් සහ ප්‍රතිඵල**: ප්‍රතිඵල සහතිකයේ මුල් පිටපත් එවීම අවශ්‍ය නොවේ.

7. **පවුලේ සාමාජිකයන්ගේ විස්තර සහ ඔවුන්ගේ මුලු මාසික ආදායම:** ඔබ පවුලේ සියලුම සාමාජිකයන්ගේ විස්තරත්, ඔවුන්ගේ රැකියාවල් සහ මුලු මාසික ආදායමත් **සංඛ්‍යාත්මකව** (අඩුකිරීම් වලට පෙර සහ වෙනත් ශිෂ්‍යත්ව මුදල්, සමුර්ධි සහනාධාර, ආදී සැම ඇතුලත්ව) සඳහන් කරන්න. මෙම විස්තරත් (රැකියාවල් ඇතුලුව), පවුලේ **මුලු ආදායමත් සංඛ්‍යාත්මකව ග්‍රාම නිලධාරීතුමා/තුමිය අත්සන් කොට නිල මුද්‍රාව තබා සහතික කල යුතුය.** මෙසේ සහතික නොකල අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

   රජයේ හෝ වෙනත් ආයතනවල රැකියාවල නියුතු (හෝ, එවැනි ආයතනවලින් විශ්‍රාම ලැබූ) පවුලේ සාමාජිකයන් වෙතොත්, ඔවුන්ගේ අලුත්ම වැටුප් පිටපත්වල ජායා පිටපත් ග්‍රාම නිලධාරීතුමා අත්සන් කොට නිල මුද්‍රාව තබා සහතික කර ඇමිනිය යුතුය. ස්ථිර ආදායමක් නොමැති හෝ ස්වයං රැකියාවල නියුතු පවුලේ සාමාජිකයන් වෙතොත්, ඔවුන්ගේ දල මාසික ආදායම (නොයෙකුත් අඩුකිරීම් වලට පෙර) ඉල්ලුම්පතේ සඳහන් කර, ග්‍රාම නිලධාරීතුමා අත්සන් කොට නිල මුද්‍රාව තබා සහතික කල යුතුය.

   ***කරුණාකර ඔබ පවුලේ සියලුම සාමාජිකයන්ගේ මුලු මාසික ආදායම පිළිබඳව අසත්‍ය තොරතුරු සැපයීමෙන් වලකින්න. එසේ කිරීමෙන් ඔබ වෙනත් අසරණ සිසුවෙකුට හිමි විය යුතු ශිෂ්‍යත්වයක් අසාධාරණ ලෙස පැහැර ගන්නා බව අමතක නොකරන්න. එමෙන්ම, සමහර අනුග්‍රාහක හවතුන් තමන්ගේ මුදල් ආධාර ලබන සිසුන් හමුවීමට පැමිණේ. එවැනි අවස්ථාවකදී ඔබ පවුලේ ආදායම පිළිබඳව අසත්‍ය තොරතුරු සපයා ඇති බව හැගුන හොත්, ඔබගේ ශිෂ්‍යත්වය වහා අවලංගු කරනු ලැබේ. එය ඔබගේ ආත්ම ගරුත්වයට නොමැකෙන කැළලක් බව තදින් සිතට ගන්න.***

8. සිසුන් තෝරා ගැනීමේදී අප විසින් සැලකිල්ලට ගතයුතු විශේෂ කරුණු තිබේ නම් (උදාහරණයක් වශයෙන්, මිය ගිය දෙමාපියන්, හෝ අංගවිකල, ආබාධිත පවුලේ සාමාජිකයන් වෙතොත්) එම විස්තර අයදුම්පතේ අනිත් පැත්තේ ලියන්න.

9. තෝරා ගත් සිසුන්ට පමණක් ජූලි - අගෝස්තු කාලසීමාවේදී පමණ ලිපි මගින් දැනුම් දෙනු ලැබේ. ඉල්ලුම්පත් විශාල සංඛ්‍යාවක් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බැවින් එම සිසුනට දැනුම්දීමක් කරනු නොලැබේ.

10. අ.පො.ස විභාග ප්‍රතිඵලවලට අමතරව අනෙක් **බාහිර කටයුතු** (ක්‍රීඩා, කථික තරඟ, ආදිය) **පිළිබඳ සහතික කිසිවක් ඇමිනිය නොයුතුය.** මෙම බාහිර කටයුතු සිසුනගේ වර්ධනයට ඉතාමත් වැදගත් වුවද, ඒවා නිසි අයුරින් ඇගයීම සිසුන් තෝරා ගැනීමේදී අප හට ඉතා අපහසු බැවින්, අ.පො.ස විභාග ප්‍රතිඵලත්, පවුලේ තොරතුරු සහ ආදායමත් (වෙනත් විශේෂ කරුණුත්) පමනක් සලකනු ලැබේ.

11. ඔබගේ අයදුම්පත විදුහල්පතිතුමා/තුමියගේ සහ ග්‍රාම නිලධාරිතුමා/තුමියගේ අත්සන් සහ නිල මුද්‍රා සහිතව නිසි පරිදි පුරවා, **අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පෙර ලැබෙන පරිදි** පහත සඳහන් ලිපිනයට එවන්න.

සහකාර සම්බන්ධිකරණ ලේකම්
ශ්‍රී ලංකා - කැනඩා ශිෂ්‍යත්ව පදනම
අංක 34, 1 වැනි හරස් පාර
පාගොඩ
නුගේගොඩ

ඔබගේ අයදුම්පත අපට ලැබීමට දින 2-3 ක් පමන ගත විය හැකිය. එබැවින්, එය ඉල්ලුම්පත් බාර ගන්නා අවසාන දිනයට දින කිහිපයකට පෙර තැපැල් කල යුතුය. එය ලියා පදිංචි තැපෑලෙන් එවීම අත්‍යාවශ්‍ය නැත.

**ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන ප්‍රධාන කරුණු** :

a. අවම සුදුසුකම් නොමැති වීම
b. පවුලේ සියලු විස්තර සහ **සංඛ්‍යාත්මකව** මුලු මාසික ආදායම ග්‍රාම නිලධාරිතුමා/තුමිය අත්සන් කොට නිල මුද්‍රාව සහිතව සහතික නොකිරීම
c. රජයේ හෝ වෙනත් ආයතනවල රැකියාවල නියුතු (හෝ, එවැනි ආයතනවලින් විශ්‍රාම ලැබූ) පවුලේ සාමාජිකයන්ගේ අලුත්ම වැටුප් පිටපත්වල ඡායා පිටපත් ග්‍රාම නිලධාරිතුමා අත්සන් කොට නිල මුද්‍රාව සහිතව සහතික කර නොතිබීම
d. **ඔබගේ ලියුම් කවරය ඇලවීමේදී, ඇලවීමට භාවිතා කරන ගම් හෝ වෙනත් ද්‍රව්‍ය ඉල්ලුම්පතේ නොගෑවීමට වග බලා ගන්න. ඉල්ලුම්පතේ ගම් ගෑවීම නිසා, එය කවරයෙන් පිටතට ගැනීම අපහසු වුවහොත්, එම ලියුම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

*නිසි ප්‍රමාණ මූලාධාර නොමැති කම නිසා ඔබ හට මෙවර ශිෂ්‍යත්වයක් පිරිනැමීමට නොහැකි වෙතොත්, ඔබ අ. පො. ස. (සා.පෙළ) විභාගය උසස් අන්දමින් සමත්වීම පිළිබඳව අපගේ සුභාශිංශන පිරිනමන අතර, ඔබගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සාර්ථක වේවා යි ඉත සිතින් පතමු!*